CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

**2013 අංක 2 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනය**

**2017 මාර්තු 10, කොළඹ, ශ්‍රී ලංකාව:** 2013 අංක 2 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත - නාමය දරණ කෙටුම්පත් පනත පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සිය දැඩි කනස්සල්ල පලකොට සිටී. 2017 පෙබරවාරි 21 වන දින මෙය කැබිනට් මණ්ඩලය මගින් අනුමත කරණු ලැබ 2017 මාර්තු 6 වන දින ගැසට් කරනු ලැබ ඇත. මෙම කෙටුම්පත් පනත අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම අරමුණු කොට ගෙන මින් පෙර ගෙන ආ කෙටුම්පත් පනතක වැඩි දියුණු කරීමක් ලෙස සැලකේ. එම පෙර ගෙන ආ කෙටුම්පත් පනත ගෙන ආ අවස්ථාවෙහි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු පරුදු පාර්ශවයන් ගනනාවක් විසින් ඉස්මතු කරණු ලැබු සැලකිලිමත් කරුනු හේතුකොටගෙන රජය විසින් එම සංශෝධනය පිළිබඳව දිගටම කටයුතු කිරීමෙන් වැලකී සිටියේය. වත්මන් කෙටුම්පත් පනත මගින් රැඳවියන්හට නීතිඥවරුන්ට ඇති ප්‍රවේශය වැනි වාර්තමානයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්තාමය සහ පරිපාලන ආරක්ෂණයන්හට නෛතික පිළිගැනීමක් ලබ්දීමට බලාපොරොත්තු වන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිල්ලට ගන්නා අතර එය අවශ්‍ය වූවක් බව ද අපි සලකමු. එසේ නමුත් යෝජිත් කෙටුම්පත් පනතේහි ඇති 6 අ (2) සහ 6 අ (6) වගන්තීන්හි බරපතල දෝෂයන් පවතින බව කිව යුතුව තිබේ. මෙම ප්‍රතිපාදනයන් නීති බවට පත් වුවහොත් එමගින් නීතිඥයකුගේ ප්‍රවේශය මගින් "සිදුවෙමින් පවතින පරීක්ෂණවලට බාධාවක් සිදුවන විට" රැඳවියන් හමුවීමට නීතිඥයන්ට ඇති ප්‍රවේශය මෙන්ම නීතිඥයන්හට පොලිස් ස්ථානයකට ඇති ප්‍රවේශය ද අහිමි කිරීමට පොලිස් ස්ථානාධිපතිවරයකුට හැකි වේ.

පොලිසිය විසින් බලය අයුතු ලෙස උපයෝගී කොට ගැනීම සහ සිර අඩස්සියේ දී සිදුවන වධහිංසා පැමිණවීම් පිළිබඳව වු හොඳින් ලේඛන ගත කරන ලද ඉතිහාසයක් ඇති සන්දර්භයක් තුළ පොලිස් ස්ථානාධිපතිවරයකුහට එවැනි පුළුල්ල බලතල සැපයීම දැඩි ලෙස කණස්සල්ල දනවන සුළු වන අතර පිළිගත නොහැකි වුවක් ද වෙයි. වැඩිදුරටත් මෙම අතිශය පුළුල් වගන්තීන් මගින් කෙටුම්පත් පනතෙහි පිලිවලින් දක්වා ඇති අනෙකුත් අයිතීන්ද අර්ථ විරහිත බවටත් පත් කරවන බව කිව යුතුව ඇත. එබැවින් මෙම කෙටුම්පත් පනත මගින් රැඳවියන් සඳහා දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා පරිපාලන ආරක්ෂණයන් පවා සීමා කෙරෙන අතර මෙම පනතෙහි පෙර අවතාරය මෙන්ම අත්අඩංගුවෙදි වධහිංසා පැමිණවීම සිදු කිරීම ඇතුළු අයිතීන් උල්ලංඝණය කිරීම් වලටද පහසුකරණයක් සපයයි. එබැවින් යෝජිත කෙටුම්පත් පනතේ ඉහත වගන්තීන් රජය විසින් ප්‍රකාශ කරනු ලැබ ඇති වධහිංසා පැමිණවීම කිසිසේත්ම නොයිවසීමට ඇති කැපවීම සමග ද නොගැලැපෙන බව පෙනේ.

මෙම නෛතික ප්‍රතිපාදනයන් තාවකාලික ලෙස පමණක් ක්‍රියාත්මක වීමට යෝජිතව ඇතත් අපකීර්තිමත් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ද (PTA) මෙසේ මුලින් තාවකාලික විධිවිදානයක් ලෙස පනවණු ලැබූවද කාලයාගේ ඇවෑමෙන් ස්ථිර බවට පත් වු බවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලැකිල්ලට ගනී. නීති සංශෝධනයන් සඳහා වන සියළු යෝජනාවන් සියළු පුරවැසියන්ගේ මානව හිමිකම් සුරකීමෙහි දී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිදු විය යුතු බවට සහතික කිරීම රජය විසින් කළ යුතුය. නොයෙසේම ඒවා පුරවැසියන්ගේ එවැනි අයිතිවාසිකම් වලට අවහිර කරන ආයුධයක් නොවිය යුතුය.

මෙම කෙටුම්පත් පනතේ 6 අ (2) සහ 6 අ (6) වගන්ති වහා ඉවත් කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී.